කොළඹ නගරයේ භෝජන ශාලා 50%ක් අවුරුදු ගණනාවක් තිස්සේ අවම සනීපාරක්‍ෂක අවැසිතා සපුරාලීමටවත් වඩා නීතියෙන් අවශ්‍ය බලපත්‍ර ලබාගෙන නැතිබව කොළඹ මහ නගරසභාවේ වෛද්‍ය නිළධාරියා පවසයි.

"තරුපහේ හෝටල් දෙකකත් පරිභෝජනයට සුදුසු

ඔහු පෙරළා පැමිණියේ නාසය හකුළා ගෙනය. එකෙනෙහිම වහා සේවකයෙකු ඇමතුවේය.

"අපිට ඔය කෙසෙල් ගෙඩියි, ජින්ජබියර් බෝතල් දෙකකුයි ගේන්න."

"ඇයි අපි දැන් මෙහෙන් කන්නෙ නැද්ද ?"

# වස ගිලින ජාතියක්



නැති කෑම තිබූ බව සොයා ගැනේ."

"රට පුරා ඇති ඔසුසල්වලින් බහුතරයෝ අවම සුදුසුකම් ලත් ඖෂධවේදීන් ද නැති අතර ඒවායින් 30%ක් බලපත්‍ර ලබාගෙන නැහැ."

අගෝස්තු අවසාන සතියේ අසන්නට ලැබුණු අමිහිරි පුවත්වලින් කිහිපයකි ඒ.

කොළඹ නගරයේ පමණක් නොව මේ රටේ බොහෝ නගරවල අලංකාර නාම පුවරුවලින් හැඳින්වුනු ආපනශාලා (හෝටල්)වල තත්ත්වය කවරදාත් එබඳු වූ බව දන්නෝ දනිති.

කොළඹ නගරයේ ජනාකීර්ණ පෙදෙස්වල ඇති භෝජන ශාලාවල ලස්සන කිරිගරුඬ මේස පෙනෙන්නට තිබේ. එහෙත් ඒවායේ වැසිකිළි පාවිච්චි කිරීමට මුළුතැන්ගේ හරහා යාමේදී කෙනෙකුට කෑම ගැනීම තබා ඒවා දෙස බැලීම ද ඉමහත් පිළිකුලකි.

මීට වසර 30කට පමණ පෙර මහ නුවර නගරයේ බො-ජුන් හලකට විශ්වවිද්‍යාල සිසුහු සිව්දෙනෙක් ගියහ. ඔවුන් ගියෝ දිවා භෝජනය ගැනීමට ය. එක් සිසුවකුට මුත්‍රා බරක් ඇති වී එය පහකිරීමට වැසිකිළියට යාමට ඕනෑ වීය.

විමතියට පත් අනෙක් මිතුරා ප්‍රශ්න කළහ.

"මචං ! මම ටොයිලට් එකට ගියා. හැබැයි කුස්සිය මැද්දෙන්. කුස්සිය වැසිකිළියට වඩා අපායක්.

ඔහුගේ පිළිතුර වීය.

දිවංගත ටී. බී. ඉලංගරත්න මහතා 1948 සිට 1958 දක්වා යුගයේදී සිය මන්ත්‍රී ධුරය අහිමි වී සිටියේය. ඒ කාලයේ දී ඉලංගරත්න මහතා චිත්‍රපටවල තිර රචනා ලිව්වේය. තවත් සමහරෙක රඟපෑවේය.

දිනක් ඒ මහතා දිවා ආහාරය සඳහා ගියේ කොළඹ බටහිර පන්නයේ බොජුන් හළකටය. එහිදී ඔහුට මිතුරෙක් මුණගැහිණි. මිතුරා පැමිණ සිටියේද දිවා ආහාරය ගැනීම සඳහා ය. ඔහු කොළඹ නගරයේ භෝජන ශාලා කිහිපයකම හිමිකරුවෙකි. පිළිසඳරට එක් වූ ඔවුන් දෙදෙනා ඉලංගරත්නයන්ගේ චිත්‍රපට දෙසට හැරුණෝය.

"මහත්තයගෙ එක චිත්‍රපටියක් නං හොඳයි. ඒත් අනිකේ දෙබස් මෙහෙම බුද්ධිමත් අයට ගැළපෙන්නේ නැහැ." මිතුරා කීවේය.

## කාලීන සටහන

"ඔබට භෝජනාගාර කිහිපයක්ම තිබෙනවා නේද ? ඔබ මෙතනටමයි එන්නේ කෑම ගන්න. ?"

"අපොයි ඔව්. පිරිසිඳුව තබා ගන්න අපිට හරි අමාරුයි. ඉඩත් මදි." භෝජනශාලා හිමිකරුවා පිළිතුරු දුන්නේය.

"ඒක තමයි මටත් කියන්න තියෙන්නේ. අපි දැන් කමු." ඉලංගරත්න කතාව එතනින් අවසන් කළේය.

කොළඹ නගරය පිරිසිඳු කිරීම මෙන්ම ජනතාව ලෙඩ කරන අපවිත්‍ර භෝජන ශාලා පිටු දැකීමද ඇරඹිය යුතුව තිබුණේ මීට අඩසියවසකටත් අතීත කාලයේ පටන්ය.

"කවරදාවත් නොවනවාට වඩා ප්‍රමාද වී හෝ පටන් ගැනීම යහපත් ය." යන ඉංගිරිසි ප්‍රස්ථාව පිරුළක් තිබේ.

දැන් කොළඹ මහ නගර සභාව ඒ දුෂ්කර කාරියට අත ගසා තිබීම සුභ ලක්‍ෂණයකි. එහෙත් ඒ වැඩ පිළිවෙළ ද සාර්ථක කර ගැනීම එතරම් පහසු නොවේ. පදිකවේදිකාවල වෙළඳාම් කිරීම (විශේෂයෙන් ආහාර පාන වෙළඳාම) කෙරෙන තාක් ලෙහෙසියෙන් මේ කටයුත්ත කළ නොහැක. මක් නිසාද යත් භෝජනා ශාලා හිමියන්ට බලවත් දේශපාලන සම්බන්ධ කථා ද තිබෙන බැවිනි. කෙසේ වුවද අපේ ආහාරවේල පිරිසිඳුව තබා ගැනීමේ සංගාමයට ජනතාව එක්විය යුතුය. හේතුව ජනතා අනුග්‍රහය සේම සහභාගීත්වය ද අත්‍යාවශ්‍ය සාධකයක් වන බැවිනි.

ඔහු අඹ ගෙඩියක් කපන ගමන් ම එසේ කීවේය.

මීට දස වසරකට පෙර බුත්තල ගිය අවස්ථාවක එහි පදිංචි පාසල් හැර ගිය මිතුරෙක් මට මෙසේ කීවේය.

"මහත්තයෝ මේ පැත්තෙ අහිංසක ගොවියෙක් දැන් පළතුරු වලටත් කාබයිට් ගහනවා."

කාලාන්තරයක් තිස්සෙ පැවත එන ක්‍රමයෙන් සමා-ජයෝ සාමාන්‍යකරණය වී ඇති 'වහ කෑම' මතට තිත තබනවාට වඩා භයානකය. මෙකී වහ කෑම තුරන් කිරීමට චින්තන විප්ලවයක් අත්‍යාවශ්‍යය.

මේ අපවිත්‍රතාව අද ඊයෙක පටන් ගත්ත එකක් නොවේ. සිගංප්පූරුවේ ලීක් වෑන් යූ 'තුන්වන ලෝකයෙන් පළමුවැනි ලෝකයට' :ඔයසරා උදරකා සබ තසරිඑ* ඔහුගේ ලංකා ගමන ගැන ලියූ පොතේ එක් ඡේදයක් උපුටා දැක්වීම කාලෝචිතය. එය මෙසේ ය.

"ඔහු (අගමැති ඩඩ්ලි සේනානායක) මා නුවරඑළියට පිටත් කොට යැවූයේ එය අංලකාර කඳුකර නිකේතනයක් වූ හෙයිනි. මා ගමන් ගත් විශේෂ දුම්රිය මැදිරියේ මා හට සපයන ලද සුවිශේෂ



ඉන්දියාවේ හිටපු නියෝජ්‍ය මහ කොමසාරිස්
ප්‍රවීණ මාධ්‍යවේදී
ඇස්.පියසේන

## සන්නස ප්‍රණාමය

### ප්‍රවීණ මාධවේදී ඇස් පියසේන මහතා
### 90 වන වියට පා ඔසවයි.

අද ශ්‍රී ලංකාවේ සිටින ජ්‍යෙෂ්ටම මාධ්‍යවේදියා ඔහු යයි කීවොත් නිවැරදි ය. සිය දැනුම පළපුරුද්ද හා අත්දැකීම් සිය පාඨකයන් හා බෙදා හදා ගන්නට තවමත් මැළි නැති මේ ප්‍රවීණ මාධ්‍යවේදියා අපට සම්පතකි. ඔහුගේ ප්‍රතිභාවෙන් ඔප් නැංවුණ සන්නසේ අපි මේ සුවිශේෂී අවස්ථාවේදී ඔහුට හිස නමා ආචාර කරන්නෙමු.

ෆෝමලින් දැමූ මාළු, කාබයිට් පිරවූ පළතුරු හා එළවලු, කල් ඉකුත් වූ කිරි ආහාර වර්ග හා මස් වර්ග බීම වර්ග, මෙකී නොකී සියල්ල කාලාන්තරයක් තිස්සේ අපේ දෛනික ආහාරයේ කොටස් බවට පත් වී ඇත. ඇත්ත වශයෙන් කියතොත් අප බොහෝ දෙනාගේ ශරීර මේ වස විස වලට ජීර්ණ වී හැඩ ගැසී තිබෙනවා යැයි කිව හැකිය. ජනතාව මේ ගැන නොදන්නවා නොවේ. කලකට පෙර හාස්‍ය හා විනෝදජනක ටෙලිනාට්‍යක් නැරඹීමි. එහි තොග පිටින් පළතුරු ගෙනැවිත් විකුණන ස්ථානයකට ව්‍යාපාර හිමියාගේ මිතුරෙක් ඇතුළු වෙයි. ඔහු පැමිණි කාරණය ගැන කතා කොට පිටත්ව යන විට එහි සේවය කරන විනෙ-ා්දකාමී නළුවා මෙසේ කියයි.

"ඔය යනවද ? පොඩ්ඩක් ඔහොම ඉන්න. මේ කාබයිට් කෑල්ලකුත් කාලා යන්න."

ආහාර නරක් වී තිබුණා පමණක් නොව විස වී තිබුණෝය. පිළුණු ගඳ ඉවසන්න බැරි වීය. මම නාන කාමරයට ගොස් වමනය කළෙමි." එළිසබත් මහ රැජිනගේ අන්තිම සංචාරයේදී ද සපයන ලද ජලයට අපවිත්‍ර දේ මිශ්‍ර වී තිබූ බව එකල පුවත්පත් වල වාර්තා වී තිබුණි.

මේ අයුරින් කලක් තිස්සේ පවතින මේ පිළිවෙත සම්පූර්ණයෙන් වෙනස් කිරීමට තවත් කාලයක් ගතවනු ඇත. එසේ වුවද, එය කල් දමනු නොහැකිය. මක් නිසාද යත් විස කෑම බීම, බෙහෙත් ආදී සියල්ල වාතය හා ජලය තරම් පිරිසිඳු විය යුතු බැවිනි.

ඒ ප්‍රයත්නය සාර්ථක නොවුණාහොත් දුම්වැටියෙන් හා මත්පැනින් වන විනාශයට වඩා වැඩි විනාශයක්, එසේම තිස්වසරක යුද්ධයටත් වඩා ව්‍යසනයක් සමස්ථ ජාතියට සිදුවනු නිසැකය. ■


**මව්බිමේ සූන්දරත්වය විඳගන්න මෙන්න ඔබටත්**

**ආරාධනා**

**දක්ෂිණ ලංකාවේ මනරම්වූත් සංස්කෘතික වටිනා කමින් වැදගත්**

**කතරගම,තිස්සමහරාමය,කිරින්ද,වැනි ස්ථාන වැඳපුදා ගැනීමටත්**

**යාල, උඩවලව, බූන්දල,වැනි මනරම් ස්ථාන නැරඹීමටත් මහගු**

**අවස්ථාවක්. ප්‍රවාහණ සහ නවාතැන් පහසුකම් ප්‍රණීත ආහාර සහ නොයෙක් අවශ්‍යතාවයන්**

**සාධාරන මිළකටත් විස්වාසනීයත්වයෙන් ඉටුකර**

**ගැනීම සඳහා පිවිසෙන්න,**

**www.travel2.webs.com or ලියා විමසන්න**

**121vinoli@gmail.com**

සන්නස
අන්තර්ජාලයෙන් කියවන්න
www.sannasa.net
www.sannasa.com